දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය, රුහුණ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2022 පුනර් පරීක්ෂණය

2023 ජනවාරි

සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය

I වන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

කාලය : පැය තුනයි (03)

---

I කොටස

**01.** පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියා අංකිත පදවලට ලුහුඬු විවරණ සපයන්න.

(අ). පිළිබිඹු <u>නෙතුපුලොත</u> නරනිඳු ලැදිපියක දුන්
මිහිවිතැ යෙහෙන් දිස්නා උවනත මත් කෙළෙ පටන්

නැත ද සෙස් <u>පිළිමිණි විත්</u> කතක මිහිමත්
නභා දෙත සිනෙ රජ රජ ළද බිසෙව් සිරි හා

(කව්සිළුමිණ, ඇම්. බී. ආරියපාල සංස්.)

(ආ). වල දින අදහසින් මෙන් <u>සුර ගඟ</u> අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන
වෙල්'ළසැ ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එමැ සඳැ උතුරින් පෙනෙන

සන්නන් සිහින් ගෙදි සෙවණලු <u>වැලි තෙලෙන</u>
තැන්තැන් වලැමැ සැතැපී සියුමැලි බැවින
රන්වන් කරල් ගෙනැ එන ගිරවුන් අතින
යන්මන් තොසින් මඟැ තොරතුරු නියම දැන

(සැලළිහිණි විවරණය, කුමරතුඟු මුනිදසුන් සංස්.)

(ඇ). පෙර මහ කිවි වරණ
පැවසූ තිලෝගුරු බණ
මම මගෙ නැණ පමණ
කීමි වරදෙක් වේද කිකරුණ

පරසතු මලින් පුද
ලද මුනිසඳුට දිය නඳ
වනපස මලින් පුද
කලැයි පවසනු කවර වර දද

(ගුත්තිල කාව්‍යය, සුචරිත ගම්ලත් සංස්.)

(ඇ). පැනසර නොවන නිරිඳුන් ලද රජ සැපත
ගොරතර නිරා දුකටත් වැඩියෙන් විපත
තිරසර නැණති නරවර ලද එම සැපත
සුරපුර සැපතටත් සිය ගුණෙනි යහපත

රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වනතුරු
මිතුරු වේය දිගතින් හමන මඳ මරු
මිතුරු නැසීමට එම වෙයි පසමිතුරු
මිතුරු නෑ කෙනෙක් නිවතුන් හට කවුරු

(සුභාෂිතය, සුචරිත ගම්ලත් සංස්.)

(ලකුණු 28)

## II කොටස

02. කව්සිළුමිණ කවියා ශෘංගාර රසය උද්දීපනයට ගත් උත්සාහය 6 වැනි සර්ගය ඇසුරෙන් විමසන්න.

03. "සැළලිහිණි සන්දේශය මනා ශබ්දාර්ථ සුසංයෝගයෙන් නිර්මිත කාව්‍යයකි." මේ පිළිබඳ ඔබේ අදහස් නිදර්ශනාශ්‍රයෙන් ඉදිරිපත් කරන්න.

04. සැණෙකෙළි වරුණෙහි දී ගුත්තිල කවියා අවස්ථෝචිත පරිදි විරිත් භාවිතයට දැක්වූ සාමර්ථ්‍යය සනිදර්ශන ව පෙන්වා දෙන්න.

05. උපදේශ කාව්‍ය සමාජ ශෝධන කාර්යයට මගපෙන්වන ආකාරය **සුභාෂිතය** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

## III කොටස

06. සිංහල භාෂාවේ ලිංග භේදය පිළිබඳ **සිදත් සඟරා** මතය දක්වා එය කොතෙක් දුරට වර්තමාන සිංහල ව්‍යවහාරයට ගැළපේදැයි සාකච්ඡා කරන්න.

07. "පියෙවි දෙවැදැරුම් දා පියෙවි සද පියෙවි වී - පද යොන් දා පියෙවි නම් විබතැනට ඇසිරු සද පියෙවි නම්" උක්ත **සිදත් සඟරා** පාඨය සනිදර්ශනව පහදන්න.

08. **සිදත් සඟරාවේ** සිංහල ක්‍රියා පදය විග්‍රහ කර ඇති අයුරු දක්වා තෙකල් කිරිය යනු කුමක්දැයි නිදසුන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනකට ප්‍රමාණවත් විවරණ සපයන්න.

i. සිංහල හෝඩිය
ii. විශේෂණ සමාසය
iii. පූර්ව ක්‍රියා සහ මිශ්‍ර ක්‍රියා
iv. උපසර්ග
v. විධි ක්‍රියා

(අංක 02 – 09 දක්වා පිළිතුරුවලට ලකුණු 18 බැගිනි.)

_________@@@@@@@@@_________